Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019/07/19 |

පැමිණිලිකරු : අයි.කේ.දොන් මනෝජ් සිරිවර්ධන මයා,
අංක 08, මුල්ගම්පොල පාර,
මහනුවර.

වගඋත්තරකරුවන් : 1. විදුහල්පති,
කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

2. එම්. අබේගුණවර්ධන මිය,
විදුහල්පතිනිය,
උසස් බාලිකා විද්‍යාලය,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/31/18**</u>

පැමිණිල්ල :-

ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය 2018.01.10 දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, ආදි ශිෂ්‍ය පදනම යටතේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා වගඋත්තරකාර කිංස්වුඩ් විද්‍යාලයට තම දරුවා වන ශනුල් ඩුලේන් සිරිවර්ධන යන අය ඇතුළත් කර ගැනිම සඳහා 2017.09.05 වන දින අයදුම්පත් යොමු කර ලකුණු 43.5 ලකුණු ප්‍රමාණයක් හිමිකර ගත් බවත් දරුවාගේ මව අයේෂා දෙව්මිණි අලහකෝන් ආසන්නතම පදිංචිකරුවන්ගේ පදනම යටතේ 2017.09.05 වන දින අයදුම්පත් යොමුකර 85 ලකුණක් හිමිකර ගත් බවත්ය.

එමෙන්ම ළමුන් ඇතුළත් කිරීමේ තාවකාලික නාමලේඛනයේ දරුවාගේ නම ආදි ශිෂ්‍ය පදනම යටතේ ඇතුලත් වී තිබු බැවින් ආසන්නතම පදිංචිකරුවන්ගේ පදනම යටතේ අභියාචනා ඉදිරිපත් නොකළ බවද සඳහන් කර ඇත. නමුත් අභියාචනා පරීක්ෂණයේදි අඩු ලකුණු 36.5 ක් ලබා සිටි ජී.ජී.සී.බී. අලහකෝන් යන අයට අසාධාරණ ලෙස ලකුණු 7.5 ක් ලබාදෙමින් ඔහුගේ 36.5 ක ලකුණු ප්‍රමාණය ලකුණු 44 ක ලකුණු



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com

ප්‍රමාණයක් දක්වා වැඩිකිරීමට කටයුතු කිරීම හේතුවෙන් තම දරුවාට මෙම විද්‍යාලයට ඇතුලත්වීමට තිබූ අවස්ථාව අහිමිකර ඇති බවත් සඳහන් කර ඇත.

එසේම තම නිවසේ සිට පාසලට ඇත්තේ 200m තරම් සුළු දුර ප්‍රමාණයක් වන අතර ස්ථිර නාමලේඛනයේ දරුවාගේ නම ඇතුළත් නොවීම හේතුවෙන් තම දරුවාට මෙම විද්‍යාලයට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත් එය තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවත්ය.

වගඋත්තරකාර පාර්ශවීය කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති වෙනුවෙන් නියෝජ්‍ය විදුහල්පති සිය කරුණු ඉදිරිපත් කරමින් ඉහත නම් සඳහන් පැමිණිලිකාර පාර්ශවය 2017.09.05 දින ආදි ශිෂ්‍ය පදනම යටතේ අයදුම්පත් යොමු කර 43.5 ක් සහ පැමිණිලිකරුගේ බිරිඳ ආසන්නතම පදිංචිකරුවන්ගේ පදනම යටතේ 2017.09.05 වන දින අයදුම්පත් යොමුකර ලකුණු 85 ක් හිමිකර ගත් නමුත් ඔවුන් අභියාචනයක් ඉදිරිපත් කර නොමැති බවත්, ආදි ශිෂ්‍ය පදනම යටතේ තීරණය වූ අවම ලකුණු ප්‍රමාණය 44ක් වන බැවින් සහ ආසන්නතම පදිංචිකරුවන්ගේ පදනම යටතේ තීරණය වූ අවම ලකුණු ප්‍රමාණය 88 වන බැවිනුත් පැමිණිලිකාර පාර්ශවයේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කර ගැනිමට සුදුසුකම් ලබා නොමැති බවත් සඳහන් කර ඇත. වගඋත්තරකාර නියෝජ්‍ය විදුහල්පති පාසලට ආසන්නතම දුර ප්‍රමාණය ඉතා කෙටිදුර ප්‍රමාණයක් බවද පිළිගන්නා ලද අතර පැමිණිලිකාර පාර්ශවය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ලබා ගෙන නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය පහත පරිදි ලකුණු ලබා ඇත.

ආදි ශිෂ්‍ය පදනම යටතේ,

| නිර්ණායකය | උපරිම ලකුණු | ලබාගත් ලකුණු |
|---|---|---|
| අයදුම්කරු පාසල් අධ්‍යාපනය ලැබූ එක් පන්තියකට (ලකුණු 2 බැගින් ) | 26 | 24 |
| පාසල් කාලය තුල අයදුම්කරු ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ | 25 | 07 |
| පාසල් කාලය තුල අයදුම්කරු ලබා ගත් විෂය සමගාමී ජයග්‍රහණ | 25 | 11.5 |
| ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය ,පාසල් කාලයෙන් පසුව ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහණ, පාසල් දියුණුව සඳහා ලබා දී ඇති විවිධ ආකාරයේ සහයෝග | 24 | 01 |
| එකතුව | 100 | 43.5 |

ආසන්නතම පදිංචිකරුන්ගේ පදනම යටතේ

| නිර්ණායකය | උපරිම ලකුණු | ලබාගත් ලකුණු |
|---|---|---|
| ඡන්දහිමි නාම ලේඛණයේ ලියාපදිංචිය | 30 | 21 |
| පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කරන ලේඛන | 15 | 10 |
| අතිරේක ලේඛන | 05 | 04 |
| පාසලට ඇති ආසන්නතාවය | 50 | 50 |
| එකතුව | 100 | 85 |

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් සලකා බැලීමෙන් පසු 2018.02.28 හා 2018.05.24 යන දෙදින මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා මූලික පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, පැමිණිලි පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීමට අනුව පැමිණිලිකරුගේ දරුවා 2018 පළමු වසරට ඇතුළත් කර ගැනිම සඳහා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ආදී ශිෂ්‍ය පදනම යටතේ අයදුම්පත් යොමුකර ලකුණු 43.5 ක ලකුණු ප්‍රමාණයක් ලබාගනිමින් තාවකාලික ලැයිස්තුවට ඇතුළත් වී ඇත. පැමිණිලිකරුගේ බිරිඳ ආසන්න පදිංචිකරුවන්ගේ පදනම යටතේ අයදුම්පත් යොමු කර ලකුණු 85 ක ප්‍රමාණයක් ලබාගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

එසේම ජී.ජී.සී.බී. අලහකෝන් මුල් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 36.5 ක ලකුණු ප්‍රමාණයක් ලබා ගනිමින් තාවකාලික ලැයිස්තුවේ පොරොත්තු ලේඛනයේ 12 වන ස්ථානයේ සිටි බවත් අභියාචනා පරීක්ෂණයේදී ලකුණු 44ක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.මේ අනුව ජී.ජී.සී.බී .අලහකෝන් පහත පරිදි ලකුණු ලබා ඇත.

| නිර්ණායකය | උපරිම ලකුණු | ලබාගත් ලකුණු | අභියාචනයෙන් ලබාගත් සුවිශේෂී ලකුණු |
|---|---|---|---|
| අයදුම්කරු පාසල් අධ්‍යාපනය ලැබූ එක් පන්තියකට (ලකුණු 2 බැගින් ) | 26 | 16 | 16 |
| පාසල් කාලය තුල අයදුම්කරු ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ | 25 | 06 | 10 |
| පාලස් කාලය තුල අයදුම්කරු ලබා ගත් විෂය සමගාමී ජයග්‍රහණ | 25 | 07 | 8.5 |
| එකතුව | 100 | 365 | 44 |

මේ අනුව කරුණු පරීක්ෂා කිරීමේදි,

චක්‍රලේඛනයට අනුව ආදි ශිෂ්‍ය සංගමය විසින් සකස් කර ඇති ලකුණු පත්‍රිකාවේ 5 වන කොටසේ පාසලේ දියුණුව සඳහා දෙන ලද විවිධිකාර සහයෝගය වෙනුවෙන් පාසලේ විදුහල්පතිතුමා විසින් පමණක් ලකුණු ලබාදිය යුතු අතර පාසලේ විදුහල්පතිතුමාගේ අනුදැනුමකින් තොරව කිසිදු අවස්ථාවක එය වෙනස් නොකළ යුතු වුවද අභියාචනා පරීක්ෂණයේදි විදුහල්පතිතුමාගේ සහභාගීත්වය නොතිබියදීත් අභියාචනා මණ්ඩලය විසින් එම නිර්ණායකය සඳහා අසාධාරණ ලෙස පි.ජී.සී.බී. අලහකෝන් යන අයට ලකුණු 7.5 ලබා දෙමින් මූලික ලකුණු 44 දක්වා වැඩි කර ඇති බව නිරීක්ෂණය වේ.

චක්‍රලේඛනයට අනුව ආදි ශිෂ්‍ය සංගමය විසින් සකස් කර ඇති ආසන්නතම පදිංචිකරුවන්ගේ ලකුණු පත්‍රිකාවේ 1 වන කොටස යටතේ පැමිණිලිකාර අයි.කේ. දොන් මනෝජ් සිරිවර්ධන මහතාගේ බිරිඳ අයේෂා දෙව්මිණි අලහකෝන් ලකුණු 21 ක ප්‍රමාණයක් ලබා ඇතත්, ඒ සඳහා ලකුණු 30 ක ලකුණු ප්‍රමාණයක් ලබාදිය යුතු බව නිරීක්ෂණය වේ. එම ලකුණු ප්‍රමාණය පැමිණිලිකරුගේ බිරිඳ විසින් ආසන්නතාවය පදනම මත ඉදිරිපත් කර ඇති අයදුම්පත සඳහා පිරිනමා තිබුනේ නම් මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 94 ක් දක්වා ඉහළ යන අතර එය කඩඉම් ලකුණු සීමාව ඉක්මවා යාමක් බවද නිරික්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරු තම දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ආදි ශිෂ්‍ය පදනම යටතේ අයදුම්පත් යොමු කර 43.5 ලකුණක් හිමිකර ගනිමින් තාවකාලික ලයිස්තුවට නම ඇතුළත් වී ඇති අතර දරුවාගේ මව අයේෂා දෙව්මිණි අලහකෝන් ආසන්නතම පදිංචි කරුවන්ගේ පදනම යටතේ අයදුම්පත්

යොමුකර ලකුණු 85 ක ලකුණු ප්‍රමාණයක් හිමිකර ගෙන ඇති වුවත් අභියාචනා පරීක්ෂණයේදී ජී.ජී.සී.බී. අලහකෝන් යන අයට සුවිශේෂී ලෙස ලකුණු ලබාදීමට කටයුතු කිරීමෙන් පැමිණිලිකාර පාර්ශවයට දැඩි අගතියක් සිදුකර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

ඒ හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ මඟින් සහතික කොට දී ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ සමාන රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන ශනුල් ඩුලේන් සිරිවර්ධන අය 2018 වර්ෂයේ වගඋත්තරකාර විද්‍යාලයේ පළමු ශ්‍රේණියට (2019 වර්ෂයේ දෙවන ශ්‍රේණියට) ඇතුළත් කර ගැනීමට පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.09.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම මයා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/